VERITÉ
විදසුන්

Originally Published in: [Newspaper, Month, Year]

**ඉන්දියාව සමඟ වෙළඳාම නැවතත් 'නිදහස්' කිරීම**

**නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs) මඟින් අපේක්ෂා කරනුයේ වෙළඳ බාධක අවම කර හවුල්කාර රටවල් අතර වෙළඳ කටයුතු පුළුල් කිරීම වේ. ඒ අනුව ශ්‍රී ලංකාව සහ ඉන්දියාව 1998 දී නිදහස් වෙළඳ ගිවිසුමකට එළඹුන අතර 2000 දී එය ක්‍රියාත්මක විය. ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) මඟින් දෙරට අතර අපනයන කරන භාණ්ඩ විශාල සංඛ්‍යාවක් සඳහා ආනයන තීරුබදු බාධක ඉවත් කරන ලදී. තීරුබදු රහිතව ඉන්දියාවට අපනයනය කළ හැකි නිෂ්පාදන අතර ශ්‍රී ලංකාවේ සැකසූ ආහාර නිෂ්පාදනද වේ.**

**කෙසේ වෙතත්, තීරුබදු රහිත ප්‍රවේශයක් මධ්‍යයේ වුවද ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාවට ආහාර අපනයනය අපේක්ෂා කළ තරම් වර්ධනය වී නැත. සැකසූ ආහාර ඉන්දියාවට අපනයනය කිරීමේදී තීරුබදු බාධක ඉවත් කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බවත් තීරුබදු නොවන බාධක (NTBs) ඉවත් කිරීමද ඉතා වැදගත් බවත් මෙවර විදසුන්නාව තීරුව මඟින් පෙන්වා දේ.**

**ඉන්දියාවට ආහාර අපනයනය සාර්ථක කර ගැනීමට අපේක්ෂා කරනුයේ මන්ද ?**

**ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සැකසූ ආහාර අපනයන, ඉන්දීය වෙළඳපොළට අපනයනය කිරීමේ ඉහළ හැකියාවක් පවතී.මන්ද එරටට ආනයනය කරන වෙනත් විදේශීය රටවල සැකසූ ආහාර මත පැනවී ඇති ඉහළ බදු බර හේතුවෙන් තීරුබදු සහන සහිත මෙරට සැකසූ ආහාර නිෂ්පාදන වලට වෙළඳපොළ වෙත පහසුවෙන් පිවිසිය හැකි වීමය. ඉන්දියාවට ආහාර අපනයනයේදී වන සාමාන්‍ය තීරු බද්ද නිෂ්පාදනයේ වටිනාකමින් 30%ක් පමණ වන අතර එය 150% දක්වා වැඩි විය හැකිය. ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ පළමු අදියර ලෙස ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාවට අපනයනය කරන සියළුම සැකසූ ආහාර නිෂ්පාදන වලට තීරු බදු සහන ලබාදීමත් දෙවනුව එම තීරු බදු සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමත් සිදු විය. වෙනත් කිසිදු රටකට මේ වන විට තීරුබදු සහන ලැබී නොතිබූ බැවින් ඉන්දීය වෙළඳපොළ වෙත සැකසූ ආහාර අපනයනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට හිමිවූයේ සැලකිය යුතු මට්ටමේ තරඟකාරී වාසියකි.**


**ඉන්දියානු ආනයනකරුවන් සහ ශ්‍රී ලාංකික අපනයනකරුවන් යන දෙකොටසමද තහවුරු කරනුයේ ඉන්දීය වෙළඳපොළ තුළ ශ්‍රී ලාංකික නිෂ්පාදන කෙරේ ඇති පාරිභෝගික ඉල්ලුම ඉහල බවය. කෙසේවෙතත්, තීරුබදු රහිත ප්‍රවේශයක් සහ ඉහළ පාරිභෝගික ඉල්ලුමක් පැවතුනද ඉන්දියාවට සැකසූ ආහාර නිෂ්පාදන අපනයනය කිරීම අභියෝගාත්මක බව අපනයනකරුවන් පවසයි.**

**මෑත වසර කිහිපය තුළ, ඉන්දියාව අනෙකුත් වෙළඳ පාශර්වකරුවන් සමඟ නව නිදහස් වෙළඳ ගිවිසුම් ගණනාවක් අත්සන් කර තිබේ. කෙසේවුවද මෙම ගිවිසුම් වලට අනුව බොහෝ සැකසූ ආහාර නිෂ්පාදන දීඝර් කාලින පදනමක් ඔස්සේ බදු ක්‍රමිකව ලිහිල් කිරීමේ ලැයිස්තුවට හෝ එහි සෘණ ලැයිස්තුවට (ගිවිසුමට ඇතුළත් නොවන නිෂ්පාදන) ඇතුළත්ව තිබේ. මේ නිසා ඉන්දියාව නව නිදහස් වෙළඳ ගිවිසුම් වලට එළඹුනු පාශර්ව රටවල් සමඟ තරඟකාරීත්වයක නියුතු වීමට තවමත් ශ්‍රී ලංකාවට අවස්ථාව තිබේ.**

**ශ්‍රී ලංකාවේ සැකසූ ආහාර නිෂ්පාදන ලෝකයේ සෙසු රටවලට සහ ඉන්දියාවට අපනයනය කිරීමෙන් අත්කරගෙන ඇති කායර්සාධනය 1 රූපසටහන මඟින් දක්වා ඇත. ඒ අනුව ලෝකයේ සෙසු රටවලට සැකසූ ආහාර අපනයනයෙන් මෙරට වෂර්යකට 38% ඉහළ වධර්න අනුපාතිකයක් අත්කරගෙන තිබේ (2011-13හැරුණු කොට). මෙම ප්‍රගතිය අත්කරගෙන ඇත්තේ ඉන්දීය වෙළඳපොළ වෙත නිෂ්පාදන අපනයනයේදී ඉන්දු-ශ්‍රී ලංකා නිදහස්**

වෙළඳ ගිවිසුම මගින් සපයන තීරුබදු සහන නොමැති තත්වයක් යටතේය. එබැවින් ඉන්දීය වෙළඳපොළ තුළ සැකසූ ආහාර නිෂ්පාදන අපනයනයේ ඉහළ වර්ධනයක් අපේක්ෂා කිරීම සාධාරණය.නමුත් ඉන්දියාවට අපනයනයේදී මුල් අවස්ථාවේදී ඇතිකරගත් සීඝ්‍ර වර්ධනය තිරසාරව ඉදිරියට පවත්වා ගැනීමට නොහැකි වී ඇත.

**1** රූපසටහන: ශ්‍රී ලංකාවේ සිට සැකසූ ආහාර අපනයනය (ඇමෙරිකන් ඩොලර් මිලියන)




* පරිච්ඡේද 16 – 21හි සඳහන් එකතු පද්ධතිවල දත්ත මූලාශ්‍ර : www.trademap.org

ඉන්දියාවට අපනයනය කිරීමේදී ඇතිවන ගැටළු තීරුබදු නොවන බාධක බවට දැක්වීම

ඉහළ ඉල්ලුමක් සහ දැඩි තරඟකාරී තත්ත්ව හමුවේ වුවද ලෝකයේ සෙසු රටවල් හා සංසන්දනයේදී ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාව දක්වා සැකසූ ආහාර අපනයනය එතරම් සාර්ථක නොවීමට හේතුව කුමක්ද? අපනයනකරුවන් පවසන්නේ මෙයට හේතුව තීරුබදු නොවන බාධකයන් බවයි.

තීරුබදු නොවන බාධක යනු කෝටා(හිමි කොටස)සීමා කිරීම, ඉතා අපහසු සහ අකාර්යක්ෂම දේශසීමා ක්‍රියාමාර්ග, නීති සහ රෙගුලාසි නොගැලපෙන ලෙස භාවිතය, විනිවිද භාවය සහ වගවීම නොමැති වීම ආදිය හැරුණු කොට වෙළඳාම සඳහා බලපාන අන් සියළුම ආකාරයේ බාධක වේ. මෙම බාධක මගින් වෙළඳ පිරිවැය ඉහළ නංවන අතර, එනිසා ආනයනික නිෂ්පාදන වලට දේශීය නිෂ්පාදන සමග තරඟ කිරීමට ඇති හැකියාව අඩු වෙයි. ඉන්දියාවට සැකසූ ආහාර අපනයනය කිරීමේදී ආහාර අපනයනකරුවන්ට මුහුණු පෑමට සිදුවූ යම් තීරුබදු නොවන බාධක අතර ආනයන බලපත්‍ර අවශ්‍යතා, ඉතා අපහසු සහ නොගැලපෙන ආනයන පිළිවෙත්, ලේබල් කිරීමේ අවශ්‍යතා පැහැදිලි නොමැති වීම, සහ ඉන්දියානු ප්‍රමිතීන් සහ රෙගුලාසි වලට අනුකූල බවට සහතික කිරීම පිණිස දැරීමට සිදුවන අතිරේක පිරිවැය සහ ඒනිසා සිදුවන අනිසි ප්‍රමාදයන්ද වේ.

එබැවින්තීරුබදු රහිත ප්‍රවේශයක් තිබියදී වුවද, ඉන්දීය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන තරඟකාරී නොවනුයේ අනිසි ප්‍රමාදයන් සහ දැරීමට සිදුවන අමතර පිරිවැය හේතුවෙනි.මීට අමතරව තීරුබදු නොවන බාධක හේතුකොට නිෂ්පාදනය වෙළඳපොළට ඉදිරිපත් කළ හැකි කාලය සහ පිරිවැය තීරණය කළ නොහැකි බැවින් ගැනුම්කරුවන් රඳවා තබා ගැනීමද අභියෝගයක් බවට පත්ව ඇත.

නිගමනය

අපනයන දිරිගැන්වීම සඳහා තීරුබදු ඉවත් කිරීම වැදගත් කරුණක් වුවද එය ප්‍රමාණවත් නොවේ. ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම තුළින් ලැබෙන තීරුබදු සහන වල ප්‍රතිලාභ නිශේධනය කරමින් වෙළඳ කටයුතු පසුබෑමට ලක්වීම අඛණ්ඩව සිදුවනුයේ තීරුබදු නොවන බාධක හේතුවෙනි. තීරුබදු නොවන බාධක වලට විසඳුම් සෙවීම පිණිස ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම තුළ ප්‍රතිපාදන සලසා නොමැත. මෙයට විසඳුම් සෙවීම සඳහා රජයන් දෙක මගින් දියත් කළ ක්‍රියාමාර්ග වල දුර්වලතා හේතුවෙන් ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර වෙළඳාම් සහ ආයෝජන

තවදුරටත් ලිහිල්කිරීමේ ප්‍රතිලාභ පිළිබඳව ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට සැකයක් මතුවී තිබේ. නව ගිවිසුමක් සඳහා වූ කතිකාවකට පමණක් නොව,පවතින ගිවිසුම පුළුල් කර ගැනීමටද ශ්‍රී ලංකාව සූදානමින්  සිටින බැවින් තීරුබදු නොවන වෙළඳ බාධක පිළිබඳව වඩා ගැඹුරින් නිරීක්ෂණය කිරීමට ඇති අවශ්‍යතාවය මෙම විශ්ලේෂණය මඟින් පෙන්වා දෙයි.